**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය - 2018**

**----------------------------------------------**

## 1.1 මතය

**------**

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 මතය සඳහා පදනම

**----------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

**------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ  වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලයේ ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

----------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

-----------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් “මනාලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය<br>---------------------- | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම<br>---------------------------------------- | නිර්දේශය<br>---------- |
|---|---|---|
| (අ) ස්වයං මූල්‍ය පාලන වැඩසටහන්වල ආදායම සහ වියදම සමාන විය යුතු නමුත් අධ්‍යයනාංශ තුනක එකතුව රු. 1,801,162 ක් වූ ආදායමට වැඩි වියදම මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබීම නිසා වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් වැඩි වී තිබුණි. | මෙම වියදම් පාඨමාලා ගාස්තු අයකිරීමට පෙර සිදුවූ බැවින් අදාල ගිණුම් වල හර ශේෂයක් පෙන්වීමට හේතුවිය. තිරසර සංවර්ධන අරමුදල් ගිණුම් සෑම අධ්‍යයන අංශ දෙපාර්තමේන්තුවකටම අදාලව පවතින අතර 2013 වර්ෂයේදී ජ´නල් සටහනක් මඟින් අදාල ගිණුම් වල බැර ශේෂයන් පොදු සංචිතයට මාරු කර ඇත. ඒ හේතුවෙන් අදාල ගිණුම්වල හර ශේෂයක් පෙන්නුම් කරනු ලබයි. | ස්වයං මූල්‍ය පාඨමාලා ආදායමට සරිලන ලෙස වියදම් දැරිය යුතු අතර ආදායමට වැඩි වියදම් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ දැක්වෙන රජයේ ප්‍රදාන සහ වෙනත් ආදායම්වලින් පියවීම නොකල යුතුය. |
| (ආ) ඉකුත් වර්ෂයට අදාළ ත්‍යාග අරමුදල් 8 ක් සඳහා ලැබුණු රු. 216,821 ක් වූ පොලී ආදායම පෙර වර්ෂයේ ආදායමට ගැලපීම වෙනුවට | 2017 වසරේදී ඉතිරිකිරීම් ගිණුම් වලට අදාල රු. 216,821 වූ පොලී මුදල 2017 වසරේ අවසාන ගිණුම් වලට ඇතුලත් නොවී තිබුණු අතර එය 2018 වසරේදී | වර්ෂයට අදාළ ආදායම් කාලානුරූපව ගැලපීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ගිණුම් ගත කර ඇත. | |

### 1.5.3 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 45.2 (XV) ප්‍රකාරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව විශ්වවිද්‍යාලය විසින් සමාලෝචිත වර්ෂයේ රු. මිලියන 290,214,000 ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. | මුදල් අතිරික්තයක් ඇති බව හඳුනාගත් අවසථාවේදී එම මුදල් ඉහළ පොලී ප්‍රතිශතයක් ලබාදෙන රාජ්‍ය බැංකුවක ආයෝජනය කරනු ඇත. අනුමැතිය ලබා ගැනීමට වැඩිපුර කාලයක් ගත වන බැවින් රු. මිලියන 290,214,000 සඳහා ආවරණ අනුමැතිය ලබාදී ඇත. | විශ්වවිද්‍යාල පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.6 ලැබිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) බැඳුම්කර අයකර ගැනීමේදී නිවැරදි ලෙස තක්සේරු නොකිරීම නිසා නිලධාරීන් 7 දෙනෙකුගෙන් රු. 400,737 ක් වැඩිපුර අයකර ගෙන තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බැඳුම්කර ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | වැඩියෙන් ලැබුණු බැඳුම්කර වටිනාකම් වලින් නිලධාරීන් දෙදෙනෙකුගේ අගයන් 2019 වර්ෂයේදී නිවැරදි කර ඇත. ඉතිරි නිලධාරීන් පස්දෙනාගේ වටිනාකම්ද 2019 වර්ෂයේදී නිවැරදි කරනු ඇත. | සියළුම බැඳුම්කර ශේෂයන් සමාලෝචනය කර ඒවා අයකර ගැනීමේ කටයුතු විධිමත් කළ යුතු අතර ක්‍රමානුකූලව සටහන් පවත්වා ගැනීමද කළ යුතුය. |
| (ආ) වර්ෂයකට වැඩි කාලයක් පැරණි එකතුව රු. 1,109,500 ක් වූ ටෙන්ඩර් තැන්පතු නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි. | 2014, 2015 සහ 2016 වර්ෂ වලට ආදාලව පැවති නැවත ලබා නොගත් ටෙන්ඩර් තැන්පතු 2018 වර්ෂයේ අදායමට ගලපා ඇති අතර වර්ෂයකට වැඩි කාලයක් පැරණි නැවත ලබා නොගත් ටෙන්ඩර් තැන්පතු මෙම වර්ෂයේදී නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) අවුරුදු 5 කට වඩා පැරණි රු. 519,200 ක් වූ පුස්තකාල තැන්පතු විශ්වවිද්‍යාලයේ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාල පුස්තකාල තැන්පතු ආපසු ගෙවිය යුතු තැන්පතු වන අතර මේවා බොහෝදුරට පාඨමාලා නිමකොට නැති සිසුන්ට අදාලව ලැබී ඇත. පාඨමාලා නිමකිරීමෙන් පසු අදාල තැන්පතු ආපසු ගෙවනු ලැබේ. | පාඨමාලා නිම කළ සිසුන්ගේ තැන්පතු ආදායමට ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1985 අංක 07 දරන පනතින් සංශෝධිත 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත 44 (1) (V) වගන්තිය | විශ්වවිද්‍යාලයේ පාලක සභාව සඳහා සාමාජිකයන් 21 දෙනෙකු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත්කර තිබුණි. එසේ වුවද එම වගන්තිය ප්‍රකාරව පරිපාලන ක්ෂේත්‍රය නියෝජනය කරමින් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් නියෝජිතයකු සහ මහා භාණ්ඩාගාරයේ නියෝජිතයෙක් පත්කිරීමට හැකියාව තිබුණද ඒ පිළිබඳ අවධානය යොමු කර නොතිබුණි. | 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත යටතේ බාහිර සාමාජිකයන් පත්කිරීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සිදුකළ යුතුය. | විශ්වවිද්‍යාලය සඳහා භාණ්ඩාගාර ප්‍රදාන ලැබෙන බැවින් භාණ්ඩාගාර නියෝජිතයෙකු සහභාගී කර ගැනීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු විය යුතුය. |
| **(ආ)** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදය | | | |
| (i) 3.7. සහ 3.8 ඡේද | සේවකයන්ගෙන් ණය වාරික අඛණ්ඩව සහ මාසිකව අයකර ගත යුතු වුවත් 2017 දෙසැම්බර් 31 දිනට එකතුව රු. 2,431,720/- ක් වූ ණය ශේෂ පැවති නිලධාරීන් 22 දෙනෙකුගෙන් එසේ මාසිකව සහ අඛණ්ඩව ණය වාරික අයකර ගෙන නොතිබුණි. | නිලධාරීන්ගෙන් 8 දෙනෙකු වෙනත් විශ්වවිද්‍යාල වෙත මාරු වී යාම නිසා ණය පවරා ගැනීමද සේවයෙන් ඉවත් වීම මත සේවකයින් 2 දෙනෙකුගෙන් අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේදී පියවීමටද කටයුතු කර ඇත. ඉහත සඳහන් කල හේතු මත ණය මුදල් වාරික වශයෙන් නොව මුළු ණය මුදලම පියවීම් සිදු කර ඇත. ඉතිරි සේවකයින් දෙදෙනාගෙන් එක අයෙකු සේවයෙන් ඉවත් වීම මත අදාල මුදල අර්ථසාධක අරමුදලින් අය කිරීමට කටයුතු කර ඇත. අනෙක් සේවකයන්ගෙන් ණය මුදල අයවීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව මාසිකව හා අඛණ්ඩව ණය වාරික අයකිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) 3.18 ඡේදය | නිලධාරීන් 04 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු. 384,870 ක් වූ ආපදා ණය ශේෂ අයකර ගැනීමට හෝ අයකර ගැනීමේ සතුටුදායක වැඩ පිළිවෙලක් යෙදීමට හෝ කටයුතු නොකර වැටුප් රහිත නිවාඩු ලබාදී තිබුණි. | වර්තමානයේ වැටුප් රහිත නිවාඩු ලබා දීමට පෙර අදාළ ණය මුදල් අයකර ගැනීමට පියවර ගෙන ඇති අතර වැටුප් අංක 3805 දරණ නිළධාරියාගේ ණය මුදල් 2019.05.29 දින විශ්වවිද්‍යාලයට ලැබී ඇත. වැටුප් අංක 8061, 7729 හා 6682 දරණ කථිකාචාර්යවරුන්ගේ අර්ථසාධක අරමුදල් නිදහස් කිරීම සඳහා මාස 03 ක වැටුප අයකර ගැනීමට කැමැත්ත ලබා නොදීම මත ප්‍රමාද වී ඇතිබැව් දන්වමි. | වැටුප් රහිත නිවාඩු ලබාදීමේදී අයවිය යුතු ණය මුදල් අයකර ගැනීමේ විධිමත් පාලන ක්‍රම ඇතිකල යුතුය. |
| **(ඇ)ශ්‍රීලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** ------------------- | | | |
| මුදල් රෙගුලාසි 757 (2) (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයේ පැවති වත්කම් සම්බන්ධයෙන් භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර එම වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | අදාළ වාර්තාව මේ වන විට ලබා දී ඇත. | මුදල් රෙගුලාසි අනුව නියමිත කාලය තුළ භාණ්ඩ සමීක්ෂණ වාර්තා ලබාදීමට කටයුතු කළ යුතුය. |
| **(ඇ)විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා සහ උසස් අධ්‍යාපන ආයතන සංග්‍රහය** ----------- | | | |
| (i) 20වෙනි පරිච්ඡේදයේ 3.1 වගන්තිය සහ 10 වෙනි පරිච්ඡේදයේ 1.6.1වගන්තිය | අධ්‍යයන සේවකයින්ගේ පැමිණීම, පිටවීම සහ නිවාඩු සනාථ කර ගැනීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතු බවට පොදු ව්‍යාපාර පිළිබඳ කමිටුවේදී උපදෙස් දී තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | මෙය විශ්වවිද්‍යාල පද්ධතියටම බලපාන කරුණක් වන බැවින් මේ සම්බන්ධයෙන් තීරණයක් ගෙන කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපදෙස් දිය යුතුය. | විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහය අනුව සහ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නිර්දේශ අනුව කටයුතු කළ යුතුය. |
| (ii) XXVI පරිච්ඡේදයේ 2.1 ඡේදය | මුදල් වර්ෂය අවසාන දිනට ආයතනයට අයත් සියලුම භාණ්ඩ සහ ස්ථාවර වත්කම්, අදාළ කාර්යය සඳහා පත් කරනු ලබන සමීක්ෂණ මණ්ඩලයක් | විශ්වවිද්‍යාලයේ පුස්තකාල පොත් ඉතා විශාල සංඛ්‍යාවක් පවතින බැවින් වාර්ෂිකව සමීක්ෂණයක් සිදු කිරීම අපහසු වේ. වසර 5 කට වතාවක් | විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයට අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | විසින් හරි වැරදි බැලිය යුතු වුවත්, 2015 වර්ෂයෙන් පසුව විශ්වවිද්‍යාලයේ පුස්තකාල පොත් පිළිබඳ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | සමීක්ෂණය සඳහා උපදෙස් ලබා දී ඇත. | |
| (ඉ)2002 නොවැම්බර් 28 දිනැති අංක එච්ඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක හා පරිගණක උපාංග සම්බන්ධයෙන්, චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. | පවතින ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත් කර ඇත. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. |
| (ඊ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 06.05.1 ඡේදය | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. තවද 2016 සහ 2017 වර්ෂවලට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමටද කටයුතු කර නොතිබුණි. | අමාත්‍යාංශය වෙත භාරදී ඇත. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |
| (උ)2015 සැප්තැම්බර් 18 දිනැති අංක 13/2015 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | විශ්වවිද්‍යාලයේ පීඨාධිපතිවරුන් 07 දෙනා විසින් වෙන්කර තිබුණු වාහන වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ දී මාසයකට හිමි ඉන්ධන ලීටර් 140 ඉක්මවා රු. 757,719 ක් වටිනා අතිරේඛ ඉන්ධන ලීටර් 6,272 ක් භාවිතා කර තිබුණි. කළමනාකරණ පීඨයේ හා ඉංජිනේරු පීඨයේ පීඨාධිපතිවරුන් සිය අනුමත ඉන්ධන සීමාව ඉක්මවා පිළිවෙලින් රු. 344,598 ක් වටිනා අතිරේඛ ඉන්ධන ලීටර් 2,624 ක් ද, රු. 173,556 ක් වටිනා අතිරේඛ ඉන්ධන ලීටර් 1,282 ක් ද භාවිතා කර තිබුණි. | අවශ්‍යතාවය මත පාලක සභාව විසින් අතිරේක ඉන්ධන චක්‍රලේඛ ප්‍රකාරව අනුමත කර ඇත. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

**1.8 තොරතුරු තාක්ෂණ (IT) පොදු පාලන ක්‍රම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විශ්වවිද්‍යාලයේ වැටුප් වාර්තා කරන පරිගණක මෘදුකාංග පද්ධතියෙහි පැවති අඩුපාඩු හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ | බාහිර විගණිත ආයතනය විසින් විශ්ව විද්‍යාලයේ කළමනාකරණ හා විගණන කමිටුවේ නිර්දේශ මත මෙම විගණනය | පවතින අඩුපාඩු හඳුනාගෙන එම අඩුපාඩු නිවැරදි කිරීම |

| | | |
|---|---|---|
| අගෝස්තු මාසයෙහි එම පරිගණක පද්ධතියේ නිවැරදිතාවය පෞද්ගලික විගණිත ආයතනයක් විසින් පරීක්ෂා කිරීමේදී යෙදුම් පාලන අවදානම් 26 ක් සහ තොරතුරු තාක්ෂණ පාලන අවදානම් 25 ක් හඳුනාගෙන තිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂය සඳහා ගෙවන ලද එකතුව රු. 2,989,043,825 ක් වූ සේවක පාරිශ්‍රමික වටිනාකමෙහි නිවැරදිතාව පිළිබඳව විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය. | සිදු කළ අතර එම හඳුනාගත් අඩුපාඩු නැවත වරක් විශ්ව විද්‍යාලයේ කළමනාකරණය සමඟ සාකච්ඡා කර නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු කරන ලදී. එම නිර්දේශයන් අනුව අභ්‍යන්තර පාලන පද්ධතිය නිවැරදි කල අතර ගෙවූ වැටුප් ගණනය නිවැරදි බව තහවුරු කරමි. වැටුප් පරිගණක පද්ධතියට ඇතුලත් කිරීම පරීක්ෂා කිරීම, සහ ගෙවීමට පෙර අනුමැතිය සිදු කර වැටුප ගෙවා ඇත. | හෝ නව පරිගණක පද්ධතියක් හඳුන්වා දීම හෝ සිදු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 159,969,855 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 224,091,778 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 64,121,923 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට වියදම් රු. 1,008,282,778 කින් වැඩි වී තිබුණද ඊට සාපේක්ෂව රජයේ පුනරාවර්තන ප්‍රදාන රු. 815,768,897 කින්ද, අභ්‍යන්තර ආදායම රු. 106,875,328 කින් සහ ක්‍රමක්ෂය රු. 153,094,571 කින් වැඩිවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

- විශ්වවිද්‍යාලයේ සමස්ථ ආදායමෙන් සියයට 77 කට වැඩි ප්‍රමාණයක් රජයේ ප්‍රදානවලින් සමන්විත වූ අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව රජයේ ප්‍රදාන සියයට 25 කින් වැඩිවී තිබුණි.

- සමාලෝචිත වර්ෂයේ පාරිතෝෂික වියදමද ඇතුළුව සේවක පාරිශ්‍රමික රු. මිලියන 3,031.23 ක් වූ අතර එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 22.47 කින් වැඩි වී තිබුණි. රු. මිලියන 3,977.93 ක් වූ සමස්ත රජයේ පුනරාවර්ථන ප්‍රතිපාදනවලින් රු. මිලියන 3,031.23 ක් එනම් සියයට 76.2 ක් සේවක පාරිශ්‍රමික සඳහා වැය කර තිබුණු අතර විශ්වවිද්‍යාලයේ අනෙකුත් සියලුම වියදම් සඳහා රු. මිලියන 946.7 ක් හෙවත් සමස්ත රජයේ පුනරාවර්ථන ප්‍රතිපාදනවලින් සියයට 23.8 ක් පමණක් යෙදවී තිබුණි.

- ඉකුත් වර්ෂයේ රු. මිලියන 35.9 ක් වූ විශ්වවිද්‍යාලයේ නඩත්තු වියදම සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 74.4 ක් දක්වා සියයට 107 කින් වැඩි වී තිබුණි.

## 2.3 අනුපාත විශ්ලේෂණය

**ලාභදායී අනුපාතය**

සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු. 159,969,855 ක්ද, මුළු ආදායම රු. 5,649,251,082 ක්ද, වූයෙන් ලාභදායී අනුපාතය සියයට ( 2.83) ක් වූ අතර ඉකුත් වර්ෂයේ එම අනුපාතය සියයට - 5.23 ක් ලෙස පැවතුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2017/2018 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ පීඨ 5 කට අදාළව සිසුන් 54 දෙනෙකු බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව එවා ඇති ලේඛනයට අනුව සිසුන් බඳවාගෙන ඇත. | නොපැමිණෙන සිසුන් වෙනුවට ඉන් පහළ සිටින සිසුන් ඇතුළත් කර ගැනීම සඳහා සුදුසු වැඩපිළිවෙලක් සකස් කළ යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ අවසානයට බැඳුම්කර කඩවීම හේතුවෙන් කථිකාචාර්යවරුන් 42 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු. 119,464,310 ක ශේෂයක් විය. එම අයවිය යුතු බැඳුම්කර ශේෂයෙන් රු. 52,706,308 ක් අවුරුදු 10 ට අඩු වූ අතර අවුරුදු 10 ට වඩා වැඩි ශේෂය රු. 6,785,622 ක් විය. බැඳුම්කර කඩ කළ වර්ෂය පවා හඳුනාගත නොහැකි වූ ශේෂය රු. 4,972,380 ක් විය. | 2018.12.31 දිනට අයවිය යුතු බැඳුම්කර වටිනාකම වන රු.119,063,568 ක් වූ ශේෂයෙන් 2019.05.31 දිනට රු.4,825,279.52 ක් අයකර ගැනීමට කටයුතු සිදු කර ඇත. අඛණ්ඩව බැඳුම්කර අයකර ගැනීමේ සිදු කරන අතර මෙම අයවීම් ක්‍රමවේදය වඩාත් කාර්යක්ෂම ලෙස අයකර ගැනීමට අවශ්‍යතාවය පිළිබඳ යොජනාවලියක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යොමුකර ඇත. | සියළු බැඳුම්කර ශේෂයන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. එමෙන්ම මෙවැනි බැඳුම්කර කඩවීම් ඉදිරියේදී ඇති නොවීමට ගිවිසුම්වල කොන්දේසි ශක්තිමත් කිරීම කෙරෙහි කළමනාකරණය අවධානය යොමු කළ යුතුය. |
| (ඇ) වෙනත් විශ්වවිද්‍යාලවලින් සජ්ත වාර්ෂික නිවාඩු ලබා පැමිණෙන නිලධාරීන් සේවයේ යොදවා ගැනීමේදී ඔවුන්ගේ පාරිශ්‍රමිකවලින් උපයන විට ගෙවීම් බදු අඩුකිරීමේ දී නියමිත බදු චක්‍රය උපයෝගී කර නොගැනීම හේතුවෙන් නිලධාරීන් 3 දෙනෙකුගේ පාරිශ්‍රමිකවලින් රු. 318,850 ක් අඩුවෙන් බදු අයකර ගෙන තිබුණි. | අඩුවෙන් අයකරගෙන ඇති උපයනවිට බදු මුදල් අදාල නිලධාරීන්ට ආපසු ගෙවන ලෙස දැනුම් දී ඇත. | සජ්ත වාර්ෂික නිවාඩු නිමවීමට පෙර දැනට සිටින නිලධාරීන්ගෙන් අදාළ බදු අයකර ගත යුතු අතර වෙනත් විශ්වවිද්‍යාලවල නිලධාරීන් පිළිබඳ තොරතුරු අදාළ විශ්වවිද්‍යාලවලට දැනුම් දීමට කටයුතු කළ යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයේ ස්ථාවර වත්කම්වල මුළු එකතුව රු. 11,170,465,273 ක් වුවද එය තහවුරු කර ගැනීම සඳහා ස්ථාවර වත්කම් මෘදුකාංගයේ එදිනට පවතින ශේෂවල එකතුවක් ලබා ගැනීමට පහසුකම් නොතිබුණි. තවද සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමෙන් පසුවද එදිනට පැවති වත්කම් වටිනාකම සඳහා මෘදුකාංගය තුළ සංශෝධනයන් සිදු කිරීමට පහසුකම් ඇති බව නිරීක්ෂණය විය. | 2018 වර්ෂයේදී භෞතික පරීක්ෂාවන් සිදුකර ස්ථාවර වත්කම් තොග යාවත්කාලීන කරමින් පවතී. | ස්ථාවර වත්කම් ලේඛනය භෞතික සත්‍යායේක්ෂණ වාර්තා සමඟ සැසඳිය හැකි ආකාරයට පරිගණක මෘදුකාංගය වැඩි දියුණු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ ආරම්භය දක්වා වූ වර්ෂ 6 ක කාලසීමාව තුළ ඇස්තමේන්තු පිරිවැය රු. 420,458,710 ක් වූ විවිධ පර්යේෂණ 317 ක් වෙනුවෙන් පර්යේෂණ හා ප්‍රකාශන කමිටුවේ අනුමැතිය විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරුන් සඳහා ලබාදී තිබුණි. ඉන් පර්යේෂණ යෝජනා 27 ක් අතහැර දමා තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ඉහත සඳහන් පර්යේෂණවලින් සියයට 59 ක් එනම් පර්යේෂණ 187 ක් සම්පූර්ණ කර නොතිබුණි. | පර්යේෂණ වාර්තා ඉදිරිපත් නොකර පර්යේෂණ අතහැර දමා ඇති කථිකාචාර්යවරුන්ගෙන් එම මුදල් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. පර්යේෂණ කමිටුව මඟින් මෙය නියාමනය කිරීමට කටයුතු කර ඇත. | පර්යේෂණ කටයුතු කාර්යක්ෂමව සහ ඵලදායී කර ගැනීම සඳහා වැඩි අවධානයක් යොමු කරමින් නව පාලන ක්‍රම හඳුන්වා දිය යුතුය. |
| (ඇ) වෛද්‍ය පීඨයේ මහාචාර්යවරියකට පිළිවෙලින් 2012, 2013, 2014 සහ 2016 වර්ෂවල එකතුව රු.4,313,800 ක් වූ පර්යේෂණ ප්‍රදාන 04 ක් අනුමත කර තිබුණු අතර එක් පර්යේෂණයක් නිම කිරීමට පෙර තවත් පර්යේෂණ ප්‍රදානයක් අනුමත කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් එක් පර්යේෂණයක් හෝ නිම කර නොතිබූ අතර මහාචාර්යවරිය විසින් 2012 පර්යේෂණ ප්‍රදානවලින් රු. 800,850 ක්ද, 2013 පර්යේෂණ ප්‍රදානවලින් රු. 1,575,000 ක්ද, අත්තිකාරම් වශයෙන් ලබා ගෙන | අවසන් වාර්තාව ඉතා ඉක්මනින් පර්යේෂණ කමිටුව වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛවලට අනුකූලව පර්යේෂණ සඳහා මුදල් වැය කළයුතු අතර පර්යේෂණ සම්බන්ධ පසුවිපරම් කටයුතු කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තිබුණි. එහිදී සාවද්‍ය ප්‍රගති වාර්තා සහ සාවද්‍ය බිල්පත් ඉදිරිපත් කිරීමද නිරීක්ෂණය විය. | | |
| (ඈ) | මුදල් ලැබීම් ඉක්මවා චෙක්පත් නිකුත් කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා දෛනිකව රු. 15,706,750 ක සිට රු. 163,374,592 ක් දක්වා මුදල් පොතේ හිඟ ශේෂ උද්ගතව තිබුණි. | සමාලෝචිත වර්ෂය තුල ජනවාරි සිට දෙසැම්බර් දක්වා දෛනික රු.15,706,750 සිට රු.163,374,592 ක් දක්වා මුදල් පොතේ හිඟ ශේෂයක් පෙන්නුම් කරනු ලැබුවද චෙක්පත් නිකුත් කිරීමේදී සැමවිටම බැංකු ශේෂයට ඍණ බලපෑමක් ඇති නොවන පරිදි නිකුත් කිරීම සිදුවේ. එසේම භාණ්ඩාගාරයෙන් මුදල් ලැබෙන තුරු චෙක්පත් පිළියෙළ කර තබාගනු ලැබේ. | මුදල් පොතේ ඍණ ශේෂ ඇති නොවන පරිදි ලැබීම්වලට සාපේක්ෂව ගෙවීම් සිදු කළ යුතුය. |

**3.3 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වෛද්‍ය පීඨය සඳහා මෙත් සෙවන ඉඩමෙන් අක්කර 5 ක බිම් ප්‍රමාණයක් පවරා ගැනීම වෙනුවෙන් 1994 ජුනි 29 දින ගෙන තිබුණු අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි 1998 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා අවස්ථා 3 කදී රු. මිලියන 24 ක්ද, සමාලෝචිත වර්ෂයේ රු. මිලියන 50 ක්ද වශයෙන් රු. මිලියන 74 ක් බස්නාහිර පළාත් සභාවට ගෙවා තිබුණද, අදාළ ඉඩම පවරා ගැනීමේ කටයුතු 2019 සැප්තැම්බර් 30 දක්වාම සිදුකර නොතිබුණි. | කඩිනමින් පවරා ගැනීමට අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර අවශ්‍ය කටයුතු කර ඇත. | පවරා ගැනීමේ කටයුතු කඩිනම් කළ යුතුය. |

**3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රසායන විද්‍යාගාර ගොඩනැගිල්ල හා නව කලාගාරය අළුත්වැඩියා කිරීමේ කාර්ය කොන්ත්‍රාත්කරු අත්හැර ගොස් තිබුණු බැවින් 2012 අප්‍රේල් 25 දින කොන්ත්‍රාත්තුව අවලංගු කර තිබුණි. එසේ වුවද, කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණු රු. 2,268,483 ක අත්තිකාරම් මුදලින් ආවරණය නොකළ වැඩ වෙනුවෙන් අයවිය යුතු රු. 1,764,013 ක් කාර්යසාධන බැඳුම්කරයෙන් අයකරගෙන නොතිබුණු අතර එම මුදල කොන්ත්‍රාත්කරුගෙන් අය කර ගැනීමට | මේ මුදල් අයකර ගැනීම සඳහා නීතිමය පියවර ගෙන ඇත. | කාර්යසාධන බැඳුම්කරයේ කාලය ඉකුත්වීමට පෙර අයවිය යුතු මුදල් අයකර ගැනීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. එසේම මෙම මුදල් නොපමාව අයකර ගැනීමට පියවර ගත යුතුය. |

සමාලෝචිත වර්ෂය තුළදීද කටයුතු කර නොතිබුණි.

### 3.5 වෙනත් සංවිධානවලට මුදාහැරී සම්පත්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2014 වර්ෂයෙහි රු. මිලියන 61.5 ක් වැය කර මිලදී ගෙන තිබුණු කොහුවල ඉඩම හා ගොඩනැගිල්ල විශ්වවිද්‍යාලයේ අවශ්‍යතාවයට නොගැලපෙන හෙයින් කැළණිය විශ්වවිද්‍යාලයේ සෞන්දර්ය අධ්‍යයන ආයතනය වෙත පවරා දී තිබූ නමුත් මෙම පැවරීම ගිණුම්ගත කර නොතිබුණු අතර, විශ්වවිද්‍යාලය භාවිතා නොකරන වත්කමක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත්ව තිබුණි. | 2017.03.07 දින පැවැත්වූ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ තීරණය පරිදි උසස් අධ්‍යාපන ලේකම්ගෙන් මෙම ඉඩම හා ගොඩනැගිල්ල නැවත පවරා දීමට අවශ්‍ය කටයුතු කරන ලෙස ඉල්ලා ඇතත් සෞන්දර්ය විශ්වවිද්‍යාලය විසින් අප විශ්වවිද්‍යාලයට ලබාදීමට කටයුතු කර නොමැත. | නියමිත පරිදි පවරා ගැනීම හෝ පවරා දීම නිම කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) රජයේ හෝ රජයේ අනුබද්ධිත ආයතනවල සේවය සඳහා වැටුප් ප්‍රතිපූරණය කිරීමේ පදනම මත 2009 වර්ෂයේදී ආරක්ෂක අමාත්‍යාංශයට මුදාහැර තිබුණු කථිකාචාර්යවරියකට ගෙවන ලද වැටුප් තුළ ඇතුළත් රු. 1,437,882 ක අධ්‍යයන දීමනා අදාළ ආයතනය වෙතින් ප්‍රතිපූරණය කළ නොහැකි බව දන්වා තිබුණි. එබැවින් එම මුදල් අදාළ කථිකාචාර්යවරියගෙන් අය කළ යුතු වුවත්, ඊට අදාළ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි. | ආරක්ෂක අමාත්‍යාංශ ලේකම් විසින් 2019.04.26 දින දීමනා සම්බන්ධව කරන ලද විමසීමට 2019.06.21 දින පිළිතුරු ලිපි යවා ඇත. ඒ අනුව මුදල් අයකර ගැනීමට කටයුතු සිදු කරනු ලැබේ. | අයකර ගැනීම් කඩිනමින් කළ යුතුය. |

### 3.6 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2017 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයේ අනුමත කාර්ය මණ්ඩලය 2,506 ක් වූ අතර එයින් අධ්‍යයන කාර්ය මණ්ඩලයේ තනතුරු 249 ක්ද, පරිපාලන කාර්ය මණ්ඩලයේ තනතුරක්ද, අනෙකුත් විධායක කාර්ය මණ්ඩලයේ තනතුරු 06 ක්ද, වෛද්‍ය තනතුරු 03 ක් ද, අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලයේ | ඉංජිනේරු සහ තාක්ෂණ පීඨයන් අළුතින් ආරම්භ කළ පීඨ බැවින් ඒවායේ තනතුරු සඳහා බඳවා ගනිමින් පවතී. එම පුරප්පාඩු ද මෙහි ඇතුළත්ය. නව පීඨ සඳහා තනතුරු ඇතුලත් කරනු ලැබුවද බඳවා ගැනීමේ පටිපාටිය 2018 වර්ෂයතුල ලැබී නොතිබුණි. ඇතැම් විශේෂිත විෂයන් | පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුය. |

| | |
|---|---|
| තනතුරු 32 ක්ද පුරප්පාඩුව පැවතුණි. තවද අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ තනතුරු 152 ක් පුරප්පාඩුව පැවතුණි. | සඳහා සුදුසුකම් සහිත ආචාර්යවරුන්ගේ අයදුම්පත් නොලැබෙන බැවින් බඳවා ගැනීම් ප්‍රමාද වී ඇත. පරිපාලන නිලධාරීන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත්කරනු ලැබේ.<br><br>876 චක්‍රලේඛය ප්‍රකාරව අදාළ අමාත්‍යාංශය විසින් පුහුණු නිලධාරී තනතුරු (කාර්මික නිලධාරී වැනි) සඳහා ලේඛන ඉදිරිපත් කර නොතිබුණි. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අයවැය පාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 102 වගන්තියට පටහැනිව මූල්‍ය වගකීම් ඇති වීමෙන් පසුව එම වටිනාකම්වලට සමානුපාතිකව අයවැය ඇස්තමේන්තුව පිළියෙල කර තිබූ බැවින් සමාලෝචිත වර්ෂයේදී අවස්ථා 10 කදී වරින්වර අයවැය ලේඛනය සංශෝධනය කර තිබුණි. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් නිකුත් කරන චක්‍රලේඛ මත වැඩිවූ වැටුප් ගෙවීම් සිදුකිරීමට හා විශ්වවිද්‍යාලයේ පසුව හඳුනා ගත් අනන්‍යතාවය මත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අමතර ප්‍රතිපාදන ලබා දී ඇත. ඒ අනුව මුල් අයවැය ලේඛනය වරින් වර සංශෝදනය කර ඇත. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම, මහා භාණ්ඩාගාරය සහ විශ්වවිද්‍යාලයේ පාලනාධිකාරිය එක්ව සාකච්ඡා මඟින් ලබා ගන්නා එකඟතාවයන්ට අනුව වර්ෂය ආරම්භ වීමට පෙර අයවැය ලේඛනය නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ආ) විශ්වවිද්‍යාලයේ 2017 වර්ෂයේ හිඟ බිල්පත් ගෙවීම සඳහා අවශ්‍ය රු. 730,000,000 ක මුදල් සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කරන ලද අයවැය ඇස්තමේන්තුව තුළ හඳුනාගෙන නොතිබුණි. | 2018 වර්ෂයේ ඇස්තමේන්තුව පිළියෙළ කිරීමේදී 2018 වසරට අදාල වියදම් පමණක් පදනම් කොට ඇති අතර රු.730,000,000 ක් 2017 වසරේදී ගෙවීමට තිබූ බිල්පත් පියවීම සඳහා ලැබූ මුදල් වන අතර ප්‍රධාන වශයෙන්ම මෙහි ඇතුලත්වී තිබුණේ ඉංජිනේරු පීඨයේ ගොඩනැගිල්ල සඳහා ගෙවිය යුතු අත්තිකාරම් මුදල්ය. මේ සඳහා ප්‍රතිපාදන ලබාදී තිබුනේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් වන අතර අදාල වර්ෂයේදී භාණ්ඩාගාරයෙන් මුදල් නොලැබීම නිසා 2018 වසරේදී ප්‍රතිපාදන ලබාදී ඇත. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම, මහා භාණ්ඩාගාරය සහ විශ්වවිද්‍යාලයේ පාලනාධිකාරිය එක්ව සාකච්ඡා මඟින් ලබා ගන්නා එකඟතාවයන්ට අනුව වර්ෂය ආරම්භ වීමට පෙර අයවැය ලේඛනය නිවැරදිව පිළියෙල කළ යුතුය. |

**4.2** **තිරසර සංවර්ධන අරමුණු**

----------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින නමුත් සමාලෝචිත වර්ෂයට අදාළව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව ප්‍රමාණවත් අවබෝධයකින් කටයුතු කර නොතිබුණි. ඒ අනුව එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව ආයතනයේ කාර්යයන්ට සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන්ද ආයතනය විසින් හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාල දර්ශකයන් හඳුනාගැනීමට අවශ්‍ය කටයුතු ඉදිරියේදී ඉටු කරනු ලැබේ. | අදාළ දර්ශකයන් හඳුනා ගැනීම කඩිනම් කළ යුතුය. |